25/09/09

32 (1)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනත

---


[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 අගෝස්තු මස 18 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 13.50 යි. තැපැල් ගාස්තුව : රු. 5.25 යි.

## 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින]

එල්. ඩී.–ඕ. 26/99.

### 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ දීර්ඝ නාමය වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කිරීමෙන් ඒ ආඥාපනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :- — 1946 අංක 13 දරන ආඥාපනතේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

> "ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා බලය දීම ; ශ්‍රී ලංකාවේ ඉඩම්වල ආර්ථික, සමාජයීය, භෞතික සහ පාරිසරික අංශ පිළිබඳ ඒකාබද්ධ සැලසුම් කිරීම ප්‍රවර්ධනය සහ නියාමනය කිරීම අරමුණු කර ගෙන ජාතික භෞතික සැලැස්මක් සෑදීම සහ ක්‍රියාත්මක කිරීම ; ස්වාභාවික පහසුකම් ආරක්ෂා කිරීම, ස්වාභාවික පරිසරය, ගෘහනිර්මාණමය සහ ඓතිහාසික වශයෙන් වැදගත් ගොඩනැගිලි සහ ස්වාභාවික ලෙස විසිතුරු ස්ථාන සංරක්ෂණය සඳහා විධිවිධාන සැලැස්වීම ; ඒ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා ඉඩම් අත්කර ගැනීම පහසු කරවීම පිණිස සහ ඉහත කී කාරණාවලට ආනුෂංගික හෝ සම්බන්ධිත කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ආඥාපනතකි.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන, 3 වන හා 4 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්ති ආදේශ කරනු ලැබේ :- — ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන, 3 වන හා 4 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

"ජාතික භෞතික සැලැස්මේ විෂය පථය. — 2. ඉඩම් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ සහ නියාමනය කිරීමේ, විධිමත් යටිතල පහසුකම්, පහසුකම් හා අවශ්‍යතා සුරක්ෂිත කිරීමේ, සහ ගෘහනිර්මාණමය, ඓතිහාසික හෝ සෞන්දර්යාත්මක වැදගත්කමින් යුතු ස්වාභාවික හා ගොඩනගන ලද

පරිසරය සහ ස්වාභාවික විසිතුරු සංරක්ෂණය කිරීමේ පොදු පරමාර්ථය ඇතිව ගොඩනැගිලි ඇති හෝ නැති වුව ද ඉඩම් සම්බන්ධයෙන් වූ ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියට අනුකූලව මේ ආඥාපනත යටතේ ජාතික භෞතික සැලැස්මක් සකස් කරනු ලැබිය හැකි ය.

ජාතික භෞතික නිර්මාණ සභාව සංස්ථාපනය කිරීම.

3. (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන පුද්ගලයන්ගෙන් සමන්විත ජාතික භෞතික නිර්මාණ සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. :-

(1) (අ) සභාපතිවරයා විය යුතු ආණ්ඩුවේ ප්‍රධානියා ;

(ආ) උපසභාපතිවරයා විය යුතු, ජාතික භෞතික සැලසුම් කිරීමේ විෂයය භාර අමාත්‍යවරයා ;

(ඇ) ආර්ථික ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා ;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා ;

(ඉ) ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා ;

(ඊ) කෘෂිකර්මය විෂයය භාර අමාත්‍යවරයා ;

(උ) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා ;

(ඌ) නිවාස විෂයය භාර අමාත්‍යවරයා ;

(එ) නාගරික සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා ;

(ඒ) ප්‍රවාහන විෂයය භාර අමාත්‍යවරයා ;

(ඔ) මහා මාර්ග විෂයය භාර අමාත්‍යවරයා ;

(ඕ) වරාය විෂයය භාර අමාත්‍යවරයා ;

(ඛ) සිවිල් ගුවන් සේවා විෂයය භාර අමාත්‍යවරයා ;

(ග) වෙරළ සංරක්ෂණය විෂයය භාර අමාත්‍යවරයා ;

(ඝ) පාරිසරික විෂයය භාර අමාත්‍යවරයා ;

(ජ) වන සංරක්ෂණය විෂයය භාර අමාත්‍යවරයා ;

(ට) සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයා ;

(ඩ) වාරිමාර්ග විෂයය භාර අමාත්‍යවරයා ;

(ණ) බලශක්ති විෂයය භාර අමාත්‍යවරයා ;

(ත) සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා ;

(ද) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයා ;

(න) සැලසුම් ක්‍රියාත්මක කිරීමේ විෂයය භාර අමාත්‍යවරයා ;

(ප) සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයා ; සහ

(බ) සියලුම පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන්.

(2) යෝජිත ජාතික භෞතික සැලැස්ම හෝ සභාව විසින් සලකා බලා ගෙන යන හෝ සලකා බැලීමට ආසන්නව ඇති වෙනත් යම් කාරණයක්, සභාවෙහි නියෝජනය නොවන යම් අමාත්‍යාංශයක සම්බන්ධතා කෙරෙහි බලපෑමක් කෙරෙන හෝ බලපෑමක් කිරීමට ඉඩ ඇති බවට සභාපතිවරයා සෑහීමට පත්වුවහොත්, ඔහු විසින්, ඒ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාට, ඒ ජාතික භෞතික සැලැස්ම සලකා බලනු ලබන සභාවේ රැස්වීම්වලට පැමිණෙන ලෙස සහ ඡන්දය ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. එසේ ඉල්ලා සිටිනු ලැබූ යම්

අමාත්‍යවරයෙක්, ඒ ජාතික භෞතික සැලැස්ම හෝ කාරණය සලකා බලන සභාවේ රැස්වීමකට පැමිණ සිටින කවර හෝ අවස්ථාවක, සභාවේ සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සභාපතිවරයා සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක, උපසභාපතිවරයා ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(4) භෞතික නිර්මාණ විෂයය භාර අමාත්‍යවරයා සභාපතිවරයා විමසීමෙන් පසු, සභාවේ රැස්වීම්වල කැඳවුම්කරු විය යුතු ය.

(5) ජාතික භෞතික නිර්මාණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරයා සභාවේ ලේකම්වරයා විය යුතු ය.

(6) මේ වගන්තියේ මීට ඉහතින්ම වූ විධිවිධාන වලට යටත්ව සභාව විසින් සභාවේ රැස්වීම් පිළිබඳ සහ ඒ රැස්වීම්වල කටයුතු කර ගෙන යාමට අදාළ කාර්ය පරිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

සභාවේ බලතල සහ කර්තව්‍ය.

4. සභාවට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය–

(අ) අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තිය සහ ජාතික භෞතික සැලැස්මේ කෙටුම්පත වෙනස් කිරීම් සහිතව හෝ රහිතව සලකා බැලීම සහ අනුමත කිරීම ;

(ආ) සභාව විසින් උපදෙස් දී ඇති පරිදි වෙනස් කරන ලද හෝ සංශෝධනය කරන ලද ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තිය හෝ ජාතික භෞතික සැලැස්මේ කෙටුම්පත නැවත ඉදිරිපත් කරන ලෙස අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවට විධාන කිරීමට ;

CS CamScanner

(ඇ) අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව විසින් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රාදේශික භෞතික සැලැස්මක කෙටුම්පතක් ඒ සැලැස්ම ජාතික භෞතික සැලැස්මට හෝ ජාතික භෞතික ප්‍රතිපත්තියට අනුකූල දැයි සලකා බැලීමට සහ ඒ සැලැස්මට අනුමතිය දීමට ;

(ඈ) නිශ්චිතව සඳහන් කරනු ලබන සංශෝධන හෝ වෙනස් කිරීම් කිරීමෙන් පසු ඒ ප්‍රාදේශික භෞතික සැලැස්මේ කෙටුම්පත නැවත ඉදිරිපත් කළ යුතු බවට වූ විධාන සහිතව ප්‍රාදේශීක භෞතික සැලැස්මේ කෙටුම්පත අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවට ආපසු යැවීමට ;

(ඉ) සභාව විසින් අනුමත කරන ලද සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ස්වකීය වාර්ෂික අයවැය ලේඛනයෙන් මුදල් ලබාදීමට සහතික වන ලෙස ජාතික භෞතික නිර්මාණ දෙපාර්තමේන්තුවට නියම කිරීමට ;

(ඊ) ආඥාපනතේ අරමුණු සාක්ෂාත් කරගැනීම සහතික කිරීම පිණිස සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි පරිදි සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කාල සීමා නියම කිරීම ඇතුළුව, අවශ්‍ය වන විධාන අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවට දීමට.".

4. 4 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ පිළිවෙලින් 4අ වන සහ 4ආ වන වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :- *ප්‍රධාන ප්‍රඥප්තියෙහි 4අ සහ 4ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.*

*"ජාතික භෞතික නිර්මාණ පිළිබඳ අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවක් සංස්ථාපනය කිරීම.*

4අ. (1) (මෙහි මින් මතු "සම්බන්ධීකරණ කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික භෞතික නිර්මාණ පිළිබඳ අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සම්බන්ධීකරණ කමිටුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද භෞතික නිර්මාණ විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද පිළිවෙලින් පහත දැක්වෙන විෂයයන් භාර අමාත්‍යවරුන්ගේ අමාත්‍යාංශවල
ලේකම්වරුන් :-

(i) භෞතික නිර්මාණය ;

(ii) ආර්ථික ක්‍රම සම්පාදනය ;

(iii) මුදල් ;

(iv) ඉඩම් ;

(v) කෘෂිකර්ම ;

(vi) කර්මාන්ත ;

(vii) නිවාස ;

(viii) ප්‍රවාහනය ;

(ix) මහා මාර්ග ;

(x) වරාය ;

(xi) සිවිල් ගුවන් සේවා ;

(xii) වෙරළ සංරක්ෂණය ;

(xiii) පාරිසරික ;

(xiv) වන සංරක්ෂණ ;

(xv) සංචාරක කටයුතු ;

(xvi) වාරිමාර්ග ;

(xvii) බලශක්ති ;

(xviii) ස්වදේශ කටයුතු ;

(xix) පළාත් සභා ;

(xx) සැලසුම් ක්‍රියාත්මක කිරීම ;

CamScanner

(xxi) සංස්කෘතික කටයුතු ;

(xxii) ධීවර ;

(xxiii) මහවැලි සංවර්ධන ;

(xxiv) වැවිලි කර්මාන්ත ;

(xxv) ඉදිකිරීම්.

(ආ) සියලුම පළාත්වල ප්‍රධාන ලේකම්වරු ;

(ඇ) ජාතික භෞතික නිර්මාණ අධ්‍යක්ෂ ජනරාල් ;

(ඈ) ජාතික ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ ජනරාල් ;

(ඉ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පත් කරන ලද නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්.

(ඊ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත යටතේ පත් කරන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්.

(3) ජාතික භෞතික නිර්මාණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සම්බන්ධීකරණ කමිටුවේ ලේකම්වරයා විය යුතු ය.

(4) යෝජිත ජාතික භෞතික සැලැස්ම හෝ සම්බන්ධීකරණ කමිටුව විසින් සලකා බලා ගෙන යන හෝ සලකා බැලීමට ආසන්නව ඇති වෙනත් යම් කාරණයක් සම්බන්ධීකරණ කමිටුවේ නියෝජනය නොවන යම් අමාත්‍යාංශයක සම්බන්ධතා කෙරෙහි බලපෑමක් කෙරෙන හෝ බලපෑමක් කිරීමට ඉඩ ඇති බවට සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා සෑහීමට පත්වුවහොත්, ඔහු විසින්, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාට, ඒ ජාතික භෞතික සැලැස්ම හෝ කාරණය සලකා බලනු ලබන සම්බන්ධීකරණ

2

කමිටුවේ රැස්වීම්වලට පැමිණෙන ලෙස සහ ඡන්දය ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. එසේ ඉල්ලා සිටිනු ලැබූ යම් ලේකම්වරයෙක් ඒ ජාතික භෞතික සැලැස්ම හෝ කාරණය සලකා බලන සම්බන්ධීකරණ කමිටුවේ රැස්වීමකට පැමිණ සිටින කවර හෝ අවස්ථාවක, සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) සභාපතිවරයා හෝ සභාපතිවරයා පැමිණ නොසිටි අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයකු විසින් සම්බන්ධීකරණ කමිටුවේ රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය.

(6) සම්බන්ධීකරණ කමිටුවේ රැස්වීම්වල දී තීරණය කිරීම සඳහා වූ සියලු ප්‍රශ්න ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්දය සම සමව ලැබුණු අවස්ථාවක දී ඒ රැස්වීමේ මූලසුන දරන සාමාජිකයා විසින් තීරක ඡන්දයක් පාවිච්චි කළ යුතු ය.

(7) සම්බන්ධීකරණ කමිටුවේ යම් රැස්වීමක ගණපූරණය සඳහා අවශ්‍ය සාමාජිකයන් සංඛ්‍යාව දහයක් විය යුතු අතර, මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, සම්බන්ධීකරණ කමිටුව විසින්, තම රැස්වීම්වල කටයුතු කර ගෙන යාම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය විධිමත් කරගනු ලැබිය හැකි ය.

සම්බන්ධීකරණ කමිටුවේ බලතල හා කාර්ය.

4ආ. (අ) ජාතික භෞතික නිර්මාණ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ජාතික භෞතික නිර්මාණ පිළිබඳ කෙටුම්පත් ප්‍රතිපත්තියක් සහ කෙටුම්පත ජාතික භෞතික සැලැස්මේ පිළියෙල කිරීමට කටයුතු සැලැස්වීම :

(ආ) ජාතික භෞතික නිර්මාණ පිළිබඳ යම් අනුමත ප්‍රතිපත්තියක් සහ යම් අනුමත ජාතික සැලැස්මක් කලින් කල අවශ්‍ය වන පරිදි සමාලෝචනය කිරීමට, ප්‍රතිශෝධනය කිරීමට හා යථාවත් කිරීමට සැලැස්වීම :

CamScanner

(ඇ) සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ජාතික භෞතික නිර්මාණ පිළිබඳ යම් කෙටුම්පත් හෝ ප්‍රතිශෝධිත ප්‍රතිපත්තියක් සහ යම් කෙටුම්පත් හෝ ප්‍රතිශෝධිත ජාතික භෞතික සැලැස්මක් පරීක්ෂාකර බැලීම ; සම්බන්ධීකරණ කමිටුව විසින්, ඒවායේ කරනු ලැබීම අවශ්‍ය යයි සලකනු ලබන යම් සංශෝධනයක් හෝ වෙනස් කිරීමක් කිරීමට සැලැස්වීම සහ ඒ පිළිබඳ සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඈ) ඒ වෙත ඉදිරිපත් කරන ලද යම් කෙටුම්පත් හෝ ප්‍රතිශෝධිත කලාපීය භෞතික සැලැස්මක් පරීක්ෂාකර බැලීම සහ ඒ පිළිබඳ සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඉ) කලාපීය භෞතික සැලැස්මක යම් උපක්‍රමික සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම පිළිබඳව සහ ඒ ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කිරීමත් පිළිබඳව සභාවට උපදෙස් දීම ;

(ඊ) සභාවෙන් ලැබුණු යම් විධාන ක්‍රියාත්මක කිරීම,

සම්බන්ධීකරණ කමිටුවේ කාර්යය විය යුතු ය.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ මධ්‍යම නිර්මාණ කොමිෂන් සභාව සම්බන්ධයෙන් කෙරෙන සෑම සඳහන් කිරීමක්ම, 4අ වගන්තිය යටතේ පිහිටුවන ලද සම්බන්ධීකරණ කමිටුව සම්බන්ධයෙන් කෙරෙන සඳහන් කිරීමක් ලෙස කියවිය යුතු අතර එලෙස තේරුම් ගත යුතු ය".

මධ්‍යම නිර්මාණ කොමිෂන් සභාව සම්බන්ධයෙන් කෙරෙන සඳහන් කිරීමක් සම්බන්ධීකරණ කමිටුව සම්බන්ධයෙන් කෙරෙන සඳහන් කිරීමක් ලෙස තේරුම් ගත යුතු බව.

CS CamScanner

ප්‍රධාන ප්‍රඥප්තියෙහි පොදු සංශෝධනය.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ "නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂවරයා" හෝ නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂවරයා හඟවමින් "අධ්‍යක්ෂවරයා" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට පිළිවෙලින් "ජාතික භෞතික නිර්මාණ අධ්‍යක්ෂ ජනරාල්" සහ "අධ්‍යක්ෂ-ජනරාල්" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5අ, 5ආ, 5ඇ, 5ඈ, සහ 5ඉ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

7. 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වන, 5ආ වන, 5ඇ වන, 5ඈ වන හා 5ඉ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :–

"ජාතික භෞතික නිර්මාණ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය සහ කර්තව්‍ය.

5අ. ජාතික භෞතික නිර්මාණ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :–

(අ) ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ;

(ආ) ජාතික භෞතික සැලැස්මක් පිළියෙල කිරීම ;

(ඇ) කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික නිර්මාණ බලධරයන් විසින් අනුගමනය කිරීම සඳහා භෞතික නිර්මාණ නියමු උපදෙස් සකස් කිරීම ;

(ඈ) කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික නිර්මාණ බලධරයාට යම් කලාපීය හෝ ප්‍රාදේශීය සැලැස්මක් පිළියෙල කිරීමට නොහැකි වූ අවස්ථාවක හෝ එවැනි සැලැස්මක් පිළියෙල කරන ලෙස ඒ බලධරයා විසින් ඉල්ලා සිටි විට, එවැනි යම් කලාපීය හෝ ප්‍රාදේශීය සැලැස්මක් පිළියෙල කිරීම ;

(ඉ) කලාපීය භෞතික සැලසුම් පිළියෙල කිරීමේ දී සහ සංවර්ධනය කිරීමේ දී පළාත් සභාවලට සහාය වීම ;

(ඊ) සභාව වෙත ඉදිරිපත් කිරීම පිණිස, ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියට අනුකූලව සම්බන්ධීකරණ කමිටුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(උ) ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තිය, ජාතික භෞතික සැලැස්ම සහ ක්‍රියාත්මකව පවතිමින් තිබෙන ජාතික භෞතික සැලසුම් ක්‍රමෝපාය වරින් වර සමාලෝචනය කිරීම සහ පරීක්ෂාකර බැලීම සහ අවශ්‍ය වූ අවස්ථාවක, ඒ ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ ක්‍රමෝපායවල වෙනස්කම් සම්බන්ධීකරණ කමිටුව වෙත නිර්දේශ කිරීම ;

(ඌ) සභාව විසින් අනුමතිය දී ඇති ජාතික භෞතික සැලැස්ම ක්‍රියාත්මක වීම නියාමනය කිරීම ; සහ

(එ) සභාව සහ සම්බන්ධීකරණ කමිටුව විසින්, ඉටු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ලේකම් කාර්යාලයක කර්තව්‍ය ඉටු කිරීම ද ඇතුළුව, සභාවේ සහ සම්බන්ධීකරණ කමිටුවේ සියලු ක්‍රියාකාරකම්වල දී සභාවට සහ සම්බන්ධීකරණ කමිටුවට සහාය වීම.

ජාතික භෞතික නිර්මාණ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ බලතල.

5ආ. (1) ජාතික භෞතික නිර්මාණ අධ්‍යක්ෂ ජනරාල්වරයාට, මේ පනත යටතේ වූ ඔහුගේ සියලු සහ යම් කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියා කිරීම පිණිස බලතල තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, ජාතික භෞතික නිර්මාණ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :—

(අ) ජාතික භෞතික නිර්මාණවලට සහ ජාතික භෞතික සැලසුම්වලට අදාළ වූ තම කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මැණීම්, විමර්ශන, අධ්‍යයනය කිරීම සහ පර්යේෂණ කර ගෙන යාම පිණිස ;

(ආ) ජාතික භෞතික සැලැස්මට අදාළ කාරණා සම්බන්ධයෙන් විශේෂඥයන්ගේ, වෘත්තිකයන්ගේ හෝ පොදු මහජනතාවගේ මතය ස්ථිර ලෙස දැනගැනීමේ අදහසින් විමසීම් පැවැත්වීම සහ ඒවාට සවන් දීම ;

(ඈ) ජාතික භෞතික නිර්මාණ විසින් ඉටු කරනු ලබන කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටු කරන්නා වූ ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි ජාත්‍යන්තර ආයතන සහ සංවිධාන සමග සම්බන්ධීකරණය ඇතිකර ගැනීම සහ පවත්වා ගෙන යාම ;

(ඈ) ජාතික භෞතික සැලැස්ම සහ කලාපීය භෞතික සැලසුම් සම්බන්ධයෙන් තොරතුරු සහ දත්ත බැංකුවක් පිහිටුවීම සහ පවත්වා ගෙන යාම ;

(ඉ) ජාතික සහ කලාපීය භෞතික නිර්මාණ පිළිබඳ සෑම අංශයකින්ම නිපුණත්ව මූලයක් ගොඩනැගීමේ අදහස ඇතිව, විශේෂඥයන් යොදා ගැනීම සහ ස්වකීය නිලධරයන්ගේ දක්ෂතා වැඩිදියුණු කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම ;

(ඊ) සංඛ්‍යා ලේඛන සහ දත්ත ඇතුළුව, ජාතික භෞතික නිර්මාණ විසින් අවශ්‍ය කරනු ලබන තොරතුරු අමාත්‍යාංශවලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින්, රාජ්‍ය සංස්ථාවලින්, ව්‍යවස්ථාපිත මණ්ඩලවලින්, පළාත් සභාවලින්, පළාත් පාලන ආයතනවලින් සහ පුද්ගලික අංශයේ ආයතනවලින් ඉල්ලා ලබා ගැනීම ;

(උ) සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අය-වැය ලේඛන වෙන් කිරීමෙහි යම් අඩුවීමක් පියවීම පිණිස, දේශීය හෝ විදේශීය වුව ද යම් ප්‍රභවයකින් අරමුදල් ලබා ගැනීම, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය තුළින් සහතික කර ගැනීම ; සහ

(ඌ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, තම මතය අනුව, ජාතික භෞතික නිර්මාණයට අදාළ වන කර්තව්‍ය ඉටු කිරීමට, බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්ය කිරීමට අවශ්‍ය බවට, ඒවාට උපකාරක හා ආනුෂංගික බවට සලකනු ලබන සියලු පියවර අනුගමනය කිරීම.

CamScanner

කාර්මික උපදේශක කමිටුව.

5ඇ. පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත, (මෙහි මින් මතු "උපදේශක කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කාර්මික උපදේශක කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය :—

(අ) 1986 අංක 23 දරන ශ්‍රී ලංකා නගර සැලසුම්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා නගර සැලසුම්කරුවන්ගේ ආයතනයේ නියෝජිතයෙක් ;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනත යටතේ පිහිටුවන ලද, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ නියෝජිතයෙක් ;

(ඇ) 1968 අංක 17 දරන ලංකා ඉංජිනේරු ආයතනය පනත යටතේ පිහිටුවන ලද ලංකා ඉංජිනේරු ආයතනයේ නියෝජිතයෙක් ;

(ඈ) 1982 අංක 22 දරන ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනයේ නියෝජිතයෙක් ;

(ඉ) ප්‍රවාහන විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු මාර්ග සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙක් ;

(ඊ) ඉඩම් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු ඉඩම් අමාත්‍යාංශයේ භූමි පරිභෝග ප්‍රතිපත්ති සැලසුම් අංශයේ නියෝජිතයෙක් ;

(උ) බලශක්ති විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජිතයෙක් ;

(ඌ) මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

CS CamScanner

(එ) ක්‍රමසම්පාදන විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(ඒ) භෞතික සැලසුම් ක්ෂේත්‍රයෙහි ලත් පළපුරුද්ද හා සුදුසුකම් සහිත පුද්ගලයන් අතුරින් එක් සාමාජිකයෙක් ;

(ඔ) ජල සම්පත් ක්ෂේත්‍රයෙහි ලත් පළපුරුද්ද හා සුදුසුකම් සහිත පුද්ගලයන් අතුරින් එක් සාමාජිකයෙක්.

උපදේශක කමිටුවේ කර්තව්‍ය.

5ඈ. උපදේශක කමිටුවේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි වේ :—

(අ) ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී සහ ජාතික භෞතික සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳව ජාතික භෞතික නිර්මාණ අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් දීම ;

(ආ) ජාතික භෞතික නිර්මාණ ක්‍රමෝපාය පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් දීම ;

(ඇ) ජාතික සහ කලාපීය භෞතික නිර්මාණවලට අදාළ වූ ද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උපදේශක කමිටුවට යොමු කරනු ලැබුවා වූ ද යම් කාරණයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් දීම.

උපදේශක කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලය.

5ඉ. (1) උපදේශක සභාවේ සෑම සාමාජිකයෙක් ම අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, ඔහු ඉල්ලා අස්වීමෙන්, මියයාමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් තම ධුරය කලින් හිස් කරනු ලැබුවහොත් මිස, තමා පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර නැවත එක් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(2) උපදේශක සභාවේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයා සිතන්නේ නම්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් ඒ සඳහා හේතු දක්වා ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) උපදේශක සභාවේ සාමාජිකයකු විසින්, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) උපදේශක කමිටුවේ යම් සාමාජිකයකු මියගියහොත්, ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් අමාත්‍යවරයා විසින් මියගිය, ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ ඒ සාමාජිකයා වෙනුවට, වෙනත් යම් තැනැත්තකු සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු ඔහු කලින් ඉල්ලා අස්වීමෙන් හෝ මියයාමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් ස්වකීය ධුරය හිස් කරනහොත් මිස, තමාගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(6) උපදේශක කමිටුවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබුණ ද උපදේශක කමිටුව විසින් එහි කර්තව්‍ය ඉටු කරනු ලැබිය හැකි ය.

(7) උපදේශක කමිටුවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය උපදේශක කමිටුවේ සාමාජිකයන් තිදෙනකුගෙන් සැදෙන්නේ ය.

(8) මේ ආඥාපනතේ විධිවිධානවලට යටත්ව, උපදේශක කමිටුව විසින් එහි රැස්වීම් සහ රැස්වීම්වල කටයුතු කර ගෙන යාම සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය විධිමත් කරගනු ලැබිය හැකි ය.

(9) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් උපදේශක කමිටුවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ —

(1) (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(අ) සභාපතිවරයා විය යුතු, පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ;

(ආ) පළාත් පාලන ආයතනය විසින් නිර්දේශ කරන ලද පළාත තුළ වූ එක් එක් පළාත් පාලන ආයතනයේ නියෝජිතයෙක් ;

(ඇ) පළාතේ දිසා ලේකම්වරුන් ;

(ඈ) නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙක් ;

(ඉ) මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහකාර මිනින්දෝරු අධිකාරිවරයකුගේ නිලයට පහළ නොවන නිලයක් දරන නිලධරයෙක් ;

(ඊ) මාර්ග සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙක් ; සහ

(උ) ආර්ථික හෝ භෞතික නිර්මාණය, පරිපාලනය, පරිසරය පිළිබඳ ක්ෂේත්‍රයෙහි හෝ භෞතික නිර්මාණයට අදාළ වෙනත් යම් ක්ෂේත්‍රයක විශිෂ්ටත්වයක් අත්කර ගෙන ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් නම් කරන ලද තුනකට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක් .";

(2) ඒ වගන්තියේ (3) වන හා (4) වන උපවගන්ති ඉවත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

කලාපීය සැලසුම් ක්‍රමය, සැලසුම් ක්‍රමය, පරිබාහිර සැලසුම් ක්‍රමය, සවිස්තර සැලසුම් ක්‍රමය, ආදිය ප්‍රතියෝජනය කිරීම.

9. (1) "කලාපීය සැලසුම් ක්‍රමය" හෝ "කලාපීය ක්‍රමය" යන යෙදුම ඇති සෑම තැනකම ඒ වෙනුවට "කලාපීය භෞතික සැලැස්ම" යන යෙදුම ;

(2) "පරිබාහිර සැලසුම් ක්‍රමය" හෝ "පරිබාහිර ක්‍රමය" යන යෙදුම ඇති සෑම තැනකම ඒ වෙනුවට "පරිබාහිර සැලැස්ම" යන යෙදුම ;

(3) "සවිස්තර සැලසුම් ක්‍රමය" හෝ "සවිස්තර ක්‍රමය" යන යෙදුම වෙනුවට "සවිස්තර සැලැස්ම" යන යෙදුම ;

(4) "සැලසුම් ක්‍රමය" හෝ "ක්‍රමය" යන යෙදුම වෙනුවට "සැලැස්ම" යන වචනය ;

ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අවසානයට "ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියට අනුකූල වන සේ " යන වචන එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන ලෙස මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියේ "නියමය අනුව" යන වචනවල සිට ඒ ඡේදය අග දක්වා වූ සියලු වචන ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"ප්‍රදේශය හෝ ඉඩම සඳහා එය විසින් කෙටුම්පත් සැලැස්මක් සකස් කිරීමට ප්‍රථම, නිර්මාණ බලධරයා විසින් උචිත යයි සලකනු ලබන ආකාරයට ඒ සැලැස්ම පිළිබඳව සාකච්ඡා කිරීමෙහි සහ සකස් කිරීමෙහි ලා සහභාගි වන ලෙස මහජනතාවට ආරාධනා කරනු ලැබිය යුතු ය ; තවද නියමයට අනුකූලව හා එහි නිශ්චිතව සඳහන් දිනයට හෝ ඊට කලින් ඒ සැලැස්ම සකස් කරනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "පැහැර හරිනු ලැබ හෝ ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති බවට " යන වචන වෙනුවට "මහජනතාවට සහභාගි වන ලෙස ආරාධනා කිරීමට හෝ පැහැර හරිනු ලැබ හෝ ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති බවට " යන වචන ආදේශ කිරීමෙන්.

(3) ඒ වගන්තියේ අගට පහත දැක්වෙන අළුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

CamScanner

"(3) යම් සංවර්ධන ප්‍රදේශයක් සඳහා යම් සැලැස්මක් පිළියෙල කිරීමේ දී සැලසුම් බලධරයා විසින් ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තිය කෙරෙහි සැලකිල්ල දැක්විය යුතු ය. ".

28 වන හා 30 වන වගන්තිවල අමාත්‍යවරයා පිළිබඳ සඳහන් කිරීම්වල දී සභාව පිළිබඳ සඳහන් කිරීම ද ඇතුළත් වන බව.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන හා 30 වන වගන්තිවල ඇතුළත් "අමාත්‍යවරයා" පිළිබඳ සෑම සඳහන් කිරීමක්ම, කලාපීය භෞතික සැලැස්මකට අදාළ වන තාක් සභාව සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ "විධිවිධානවලට යටත්ව" යන වචන වෙනුවට "ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියට සහ විධිවිධානවලට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ—

"අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය යුතු ය" යන වචන වෙනුවට "ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියට යටත්ව අමාත්‍යවරයා විසින් සෑදිය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ:—

"මෙම නීතිය වෙනත් නීති අභිභවා බලපවත්නා බව.

88. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මේ නීතියේ විධිවිධාන බලාත්මක විය යුතු අතර ඒ අනුව, මේ නීතියේ විධිවිධාන සහ ඒ වෙනත් නීතියේ විධිවිධාන අතර ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇතිවුවහොත් ඒ වෙනත් නීතිය අභිබවා මේ නීතියේ විධිවිධාන බලපැවැත් විය යුතු ය.".

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත සංශෝධනය කිරීම.

**16.** (මේ උපවගන්තියේ "පනත" යනුවෙන් සඳහන් කෙරෙන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

CamScanner

(1) 8 වන වගන්තියෙහි—

(i) "යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත" යන වචන වෙනුවට "ජාතික භෞතික නිර්මාණ දෙපාර්තමේන්තුව විසින් තත් කාර්යය සඳහා සකස් කරන ලද යම් නියමු උපදෙස්වලට යටත්ව යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) (ජ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ජ) ඒ ප්‍රදේශවල යම් තැනැත්තකුගේ යම් සංවර්ධන යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක් හෝ යම් සංවර්ධන ක්‍රියාකාරකමක් සම්බන්ධීකරණය කිරීම, නියාමනය කිරීම හෝ පාලනය කිරීම පිණිස;".

(2) 8ඒ වගන්තියෙහි (1) වන උපවගන්තියේ "වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද කිසිදු රාජ්‍ය නියෝජ්‍යායතනයක් හෝ වෙනත් යම් තැනැත්තකු විසින්" යන වචන වෙනුවට "කිසිදු තැනැත්තකු විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

(3) 28ඇ වගන්තියෙහි–

(i) "(අ) තැනැත්තන් මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් සිදු කරන ලද අවස්ථාවක" යන වචන වෙනුවට "තැනැත්තන් මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් සිදු කරන ලද අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (iv) වන අනුඡේදයේ "නිලධරයකු ; හෝ" යන වචන වෙනුවට "නිලධරයකු"; යන වචනය ආදේශ කිරීමෙන් ;

(iii) ඒ වගන්තියේ (ආ) ඡේදය ඉවත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

17. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

CamScanner